**රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 7/93**

රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
1993.04.26

සියළුම ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා
මහ බැංකුවේ අධිපති.

**<u>1993 පළාත් සභා ඡන්ද පැවැත්වීම සඳහා නිලධාරීන්</u>**

ඉදිරියේදී පැවැත්වීමට නියමිත පළාත් සභා ඡන්ද විමසීමේ කාර්යය සඳහා මැතිවරණ කොමසාරිස්ට සහ තේරීම් භාර නිලධාරීන්ට රාජ්‍ය සේවයේ හා මහ බැංකුවේ සියළුම නිලධාරීන්ගේ සේවය ලබා ගැනීම අවශ්‍යව ඇත. මැතිවරණ රාජකාරි සඳහා යෙදවීමට මුලින්ම තෝරා ගෙන ඇති නිලධාරීන්ට අමතරව සේවයේ යෙදවීමට අවශ්‍ය වුවහොත් එසේ ලබා ගැනීම සඳහා අනික් සියළු නිලධාරීන් ද පොරොත්තු සේවයේ සිටිය යුතුය.

02. එම නිසා ඔබ යටතේ සේවය කරන නිලධාරීන් සම්බන්ධව ඔබ විසින් පහත සඳහන් ක්‍රියාමාර්ගය අනුගමනය කළ යුතුය.

(අ) පළාත් සභා සේවාවන් ඇතුළුව මහ බැංකුවේ හා රාජ්‍ය සේවයේ කිසිම නිලධාරියෙකුට දෙදිනම ඇතුළුව 1993.05.09 සිට 1993.05.18 දක්වා කාලය තුළදී නිවාඩු අනුමත නොකළ යුතුය. මෙම කාලය ඇතුලත ලබා ගැනීම සඳහා දැනටමත් අනුමත කර ගෙන ඇති නිවාඩු ද අවලංගු කළා සේ සැලකිය යුතුය. කෙසේ වුවද, අසනීපයක් වැනි අත්‍යාවශ්‍ය අවස්ථාවන් සඳහා මැතිවරණ කොමසාරිස්ගේ උපදෙස් ඇතිව නිවාඩු අනුමත කිරීම ගැන අදාළ අමාත්‍යාංශයේ ලේකම් විසින් තීරණයක් ගත යුතුය.

(ආ) මාස තුනක් හෝ ඊට වැඩි කාලයක් සඳහා වන අධ්‍යයන නිවාඩු වෙනුවෙන් හැර වෙනත් රාජකාරි හෝ පෞද්ගලික කටයුතු සඳහා ඉහත සඳහන් කාල සීමාව ඇතුලත විදේශ සංචාරවල යෙදීමට අවසර නොදිය යුතුය. මෙම නියමයන්ට අනුකූල නොවන සේ දැනටමත් දී ඇති අවසරයක් අවලංගු වූවා සේ සැලකිය යුතුය. අති විශේෂ කරුණු නිසා නිලධාරියෙකුගේ විදේශ සංචාරයක් අත්‍යාවශ්‍ය යයි හා කල් දැමිය නොහැකි යයි අමාත්‍යාංශයේ ලේකම් හෝ මහ බැංකුවේ අධිපති අදහස් කරන්නේ නම් එවැනි අවස්ථාවක් සම්බන්ධව සම්පූර්ණ විස්තරයක් ජනාධිපති ලේකම් වෙත වාර්තා කළ යුතුය.

(ඇ) මෙම කාලය තුළදී කිසිම නිලධාරියෙකු මැතිවරණ කටයුතුවල යෙදවීමට අපහසුවක් ඇති නොවන ආකාරයට විදේශ දූත පිරිස් හමුවී සාකච්ජා කිරීම, සම්මන්ත්‍රණ සාකච්ජා සහ පුහුණු වැඩ සටහන් ඇතුළු සියළුම රාජකාරිමය කටයුතු යොද ගැනීමට හෝ නැවත යොද ගැනීමට සියළුම අමාත්‍යාංශ, පළාත් සභා සහ මහ බැංකුව වග බලා ගත යුතුය.

අ.කලේ/එම්.එන්. ජුනයිඩ්.
ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය